# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 65 දරන කැළෑ
## (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 නොවැම්බර් මස 16 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 නොවැම්බර් මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 28.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 10.00 යි.

# 2009 අංක 65 දරන කැළෑ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 නොවැම්බර් මස 16 වන දින]

එල්.ඩී.—ඕ. 64/2000.

**කැළෑ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 65 දරන කැළෑ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන), කැළෑ ආඥාපනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ:— 451 වන පරිච්ඡේදයේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

"වන සම්පත් සංරක්ෂණය කිරීමට, ආරක්ෂා කිරීමට සහ ඒවායේ තිරසාර කළමනාකරණය සඳහා ද, වන නිෂ්පාදන භාවිතයට ගැනීමට අදාළ නීතිය ඒකාබද්ධ කිරීම හා සංශෝධනය කිරීම සඳහා ද, දැව හා වන නිෂ්පාදන ප්‍රවාහනය හා ඒ ප්‍රවාහනයට අදාළ වෙනත් කටයුතු විධිමත් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි."

3. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක— ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන පොදු සංශෝධන.

(අ) "කැළෑ ආඥාපනත" යන වචන වෙනුවට "වන සංරක්ෂණ ආඥාපනත" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.;

(ආ) "වන සංරක්ෂක" යන වචන වෙනුවට "වන සංරක්ෂක ජනරාල්" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) යම් නියෝගයක, රීතියක, දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "කැළෑ ආඥාපනත" සහ "වන සංරක්ෂක" සම්බන්ධයෙන් වන සෑම සඳහනක්ම, පිළිවෙළින් "වන සංරක්ෂණ ආඥාපනත" සහ "වන සංරක්ෂක ජනරාල්" යනුවෙන් කියවා තේරුම් ගත යුතු ය.

2-PL 004318 —3,490 (2009/08)

ප්‍රධාන ප්‍රඥප්තියේ ශීර්ෂ පාඨය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන පරිච්ඡේදය යන ඉලක්කමට හා වචනවලට ඉක්බිතිවම දැක්වෙන ශීර්ෂ පාඨය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂ පාඨය ආදේශ කරනු ලැබේ:—

"රක්ෂිත හා සංරක්ෂණ වනයන් "

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තිය, එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(2) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබූ අවස්ථාවක දී ජෛව විවිධත්වය, පස හා ජලය සංරක්ෂණය කිරීමේ කාර්යය සහ එහි අනන්‍ය පරිසර පද්ධති, ජාන සම්පත් සහ දුර්ලභ හා වඳවීමේ තර්ජනයට ලක්ව ඇති වන සත්ව හා වෘක්ෂලතා විශේෂ ද සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි ආකාරයට, වන සංරක්ෂක ජනරාල්වරයා විසින් රක්ෂිත වනයන් සඳහා කළමනාකරණ සැලැස්මක් පිළියෙල කළ යුතු ය.

(3) රක්ෂිත වනයක් සඳහා පිළියෙල කරන කළමනාකරණ සැලැස්ම, වන සංරක්ෂක ජනරාල්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා ලිඛිතව බලය පවරන ලද වෙනත් නිලධරයකු හෝ විසින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන කාර්යය සඳහා, නියම කරනු ලැබිය හැකි ආකාරයට, ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයා විසින් රක්ෂිත වනයක් හෝ එහි නිශ්චිතව සඳහන් කොටසකට බලපාන පරිදි පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය යුතු ය :—

(අ) රක්ෂිත වනයන් පරිපාලනය හා කළමනාකරණය ;

(ආ) කළමනාකරණ සැලැස්මට ඇතුළත් කිරීමට නියමිත කාරණා සහ එම කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කළ යුතු ආකාරය හා කාර්ය පටිපාටි ;

(ඇ) රක්ෂිත වනයන්හි තිරසාර කළමනාකරණයේ දී ජන කොටස්වල හා රාජ්‍ය නොවන අංශයේ සහභාගීත්වය ලබා ගැනීමේ කාර්යය සඳහා කළමනාකරණ ගිවිසුම් පිළියෙල කිරීම ;

(ඈ) මේ උපවගන්තිය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන්, එම ගාස්තු හෝ අය කිරීම් සියලු අවස්ථාවන්හි දී වනයෙන් ලබා ගන්නා මූල්‍යමය හෝ අන්‍යාකාර ප්‍රතිලාභවල වටිනාකමට සමානුපාත වන අයුරින් ගාස්තු හෝ අය කිරීම් පැනවීම. වලංගු ලෙස ප්‍රකාශයට පත් කරනු නොලැබූ යම් ප්‍රතිලාභයක් ලබා ගැනීම මගින්, මේ ආඥාපනත යටතේ වරදක් සංයුක්ත වන අතර, එය අධිකරණය විසින් පනවන ලද දඩයක් ලෙස නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි අයකර ගත යුතු ය ;

(ඉ) එම වනාන්තර කළමනාකරණය කිරීමට අදාළව ගිවිසුම්වලට ඇතුළත්වීම, එම ගිවිසුම් අවලංගු කිරීම, කොන්දේසි පැනවීම, ගාස්තු නියම කිරීම, ආරවුල් සමථයකට පත් කිරීම සඳහා ක්‍රමෝපායන් සකස් කිරීම ;

(ඊ) කළමනාකරණ හවුල්කරුවන් හා ලාභයේ කොටස්කරුවන් අතර ප්‍රතිලාභ බෙදා හැරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම ;

(උ) දැව නොවන වන නිෂ්පාදන සහ මැරුණු සහ වැටී ඇති කෝටු ප්‍රාදේශීය ප්‍රජාව විසින් ඉන්ධන වශයෙන් භාවිතයට ගැනීමට අවසර ලබාදීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ;

(ඌ) රක්ෂිත වනයක් තුළ කරගෙන යනු ලබන ක්‍රියාකාරකම්වලට අදාළ කොන්දේසි ; සහ

(එ) රක්ෂිත වනයක විද්‍යාත්මක පර්යේෂණ කිරීම සඳහා අවසර දෙනු ලබන ප්‍රදේශ සහ එකී පර්යේෂණ කිරීමේ දී යටත්වනු ලැබිය යුතු කොන්දේසි.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3අ වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 3අ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලබේ:—

“(3) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති නිර්නායක සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි ආකාරයට වන සංරක්ෂක ජනරාල්වරයා විසින් සංරක්ෂණ වනයන් සඳහා කළමනාකරණ සැලැස්මක් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(4) කළමනාකරණ සැලැස්ම පිළියෙල කරනු ලැබුවේ යම් සංරක්ෂණ වනයක් සඳහා ද, ඒ සඳහා වූ කළමනාකරණ සැලැස්ම, වන සංරක්ෂක ජනරාල්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් ලිඛිතව බලය පවරන ලද නිලධරයකු විසින් (1) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි ආකාරයට ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(5) කළමනාකරණ සැලැස්මේ ඇතුළත් කළ යුතු කාරණා සම්බන්ධයෙන් සහ එම කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය කිරීම සිදු කළ යුතු ආකාරය සහ ඒ පිළිබඳ කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(6) (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයට පත් කර ඇති සංරක්ෂණ වනයක පැවැත්ම හා ආරක්ෂාව සඳහා රජයේ ඉඩමක් නොවන්නා වූ ද (1) වන උපවගන්තියේ සඳහන් කවර හෝ ලක්ෂණයක් ඇත්තා වූ ද යම් නිශ්චල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, එම නිශ්චල දේපළ, අමාත්‍යවරයාගේ නිර්දේශය මත (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3ඇ වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 3ඇ වගන්තියේ “සංරක්ෂිත වනාන්තර ” යන වචන යොදා ඇති සෑම ස්ථානයකට ම අවස්ථාවෝචිත පරිදි “සංරක්ෂණ වනාන්තර හෝ රක්ෂිත වනාන්තර” යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ හා ඒ වගන්තියේ පැති සටහනේ ඇති “රක්ෂිත වනයක” යන වචන වෙනුවට “සංරක්ෂණ වනයක හෝ රක්ෂිත වනයක” යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ පළමුවන අතුරු විධානයේ සහ දෙවන අතුරු විධානයේ “ආණ්ඩුවේ ඒජන්ත” යන වචන වෙනුවට “ ප්‍රාදේශීය ලේකම්” යන වචන ආදේශ කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

“සංරක්ෂණ වනයක තහනම් කරන ලද ක්‍රියා.

6. (1) කිසිම තැනැත්තකු හට—

(අ) සංරක්ෂණ වනයක් ඇතුළත විද්‍යාත්මක පර්යේෂණයක නිරතවීමේ ;

(ආ) සංරක්ෂණ වනය තුළ පිහිටි වනජීවී හා වෘක්ෂලතා නිරීක්ෂණය කිරීමේ ; හෝ

(ඇ) කළමනාකරණ සැලැස්මේ නියම කරනු ලැබ ඇති කටයුතු ක්‍රියාත්මක කිරීමේ,

කාර්යය සඳහා සහ වන සංරක්ෂක ජනරාල් විසින් හෝ ඒ වෙනුවට ඔහු විසින් බලය දෙන තැනැත්තකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක අධිකාරය මත මිස, සංරක්ෂණ වනයකට ඇතුල්වීමට අවසර නොදිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සංරක්ෂණ වනයක —

(අ) එයට අයුතු ලෙස ඇතුල්වන හෝ අයුතු ලෙස ඇතුල්වීමට සලස්වන හෝ එහි රැඳී සිටින ;

(ආ) යම් පැලෑටියක්, ගසක් හෝ දැව කපා හෙලන, කපන, ඉරන හෝ කපා හෙලීමට, කැපීමට හෝ ඉරීමට සලස්වන නැතහොත් වෙනස් කරන, සංවර්තනය කරන, එකතු කරන, ඉවත් කරන හෝ ප්‍රවාහනය කරන හෝ ලකුණු කරන හෝ කප්පාදු කරන හෝ පට්ටම් දමන හෝ යම් වන නිෂ්පාදනයක් තම සන්තකයේ, භාරයේ හෝ පාලනයේ තබා ගැනීම කරන හෝ පලංචියක් ඉදිකරන හෝ ලී ඉරන වලක් තනන ;

(ඇ) යම් ගසකින් පොතු හෝ කොළ ඉවත් කරන හෝ ගසකින් පොත්ත ගලවා දමන, නැතහොත් එහි අතු කපන හෝ යම් ගසක යුෂ ගන්නා හෝ පුළුස්සන හෝ අන්‍යාකාරයකින් එයට හානි කරන ;

(ඈ) ගවයන්ට අයුතු ලෙස ඇතුළු වීමට ඉඩ දෙන හෝ තණකොළ හෝ වෙන යම් පැලෑටියක් කපන, නැතහොත් ඒ තණකොළ හෝ පැලෑටි ගවයන්ට කෑම සඳහා ලබා දෙන ;

(ඉ) එම වනය තුළ ඇති යම් දිය පහරකට අවහිර කරන හෝ ජලනළ හෝ වෙනත් ක්‍රමයකින් එම දිය පහරෙන් ජලය ලබා ගන්නා හෝ වනයේ කුණු කසල බහාලීමෙන් හා වනයට කුණු කසල බැහැර කිරීමෙන් ජලය අපවිත්‍ර කරන හෝ ජලය විස කරන නැතහොත් වන පරිසරය අපවිත්‍ර කරන ;

(ඊ) යම් පැලෑටියක් හෝ එහි යම් කොටසක් ප්‍රවාහනය කරන, ඉවත් කරන, මුලිනුදුරා දමන හෝ විනාශ කරන, නැතහොත් යම් පැලෑටියකට හෝ එහි යම් කොටසකට යම් පාඩුවක් හෝ හානියක් කිරීමට සලස්වන ;

(උ) එම වනය තුළ ඇති යම් පැලෑටියක් විකුණන, අනාවෘතව තබන, ප්‍රදර්ශනය කරන හෝ විකිණීමට අර්පණය කරන ;

(ඌ) යම් පක්ෂියකු, සිවුපාවකු, උරගයකු හෝ උභය ජීවියකු මරණයට පත් කරන, එසේ කිරීමට සලස්වන හෝ උගුල් හෝ පුඩු හෝ තුවක්කු ඇටවීමක් කරන සහ පහරදීම සඳහා ස්ථාන ඉදි කරන හෝ එවැනි ස්ථාන භාවිත කරන නැතහොත්, එවැනි යම් පක්ෂියකුට, සතෙකුට, උරගයකුට හෝ උභය ජීවියකුට, හිරිහැර කරන හෝ බාධා කරන හෝ වෙඩි තබන හෝ හිරිහැර කිරීමට, බාධා කිරීමට හෝ වෙඩි තැබීමට තැත් කරන හෝ එවැනි යම් පක්ෂියකු, සතකු, උරගයකු හෝ උභය ජීවියකු ඉවත් කිරීමට තැත් කරන;

(එ) යම් පක්ෂියකු, සතකු, උරගයකු හෝ උභය ජීවියකු හෝ එවැනි යම් පක්ෂියකුගේ, සතකුගේ, උරගයකුගේ හෝ උභය ජීවියකුගේ, යම් කොටසක් විකුණන, විකිණීම සඳහා ඉදිරිපත් කරන හෝ විකිණීම සඳහා අනුමත කරන;

(ඒ) යම් පක්ෂියකුගේ හෝ සතකුගේ හෝ උරගයකුගේ යම් බිත්තරයක් ගනු ලබන හෝ විනාශ කරනු ලබන නැතහොත් යම් පක්ෂියකුගේ හෝ සතකුගේ හෝ උරගයකුගේ කූඩුවක් හෝ වාසස්ථානයක් ඉවත් කරන හෝ විනාශ කරන;

(ඔ) යම් සතකුට බාධා වන හෝ බාධාවක් සිදුවිය හැකි තුවක්කු පත්තු කිරීමක් කරන හෝ වෙනත් යම් ක්‍රියාවක් කරන, නැතහොත් එවැනි යම් සතකුගේ අභිජනන ස්ථානයකට බාධා වන හෝ බාධා සිදුවිය හැකි යම් ක්‍රියාවක් කරන;

(ඕ) යම් සතකුට හෝ පැලෑටිකට තුවාල කිරීමේ හෝ විනාශ කිරීමේ හැකියාවක් ඇත්තා වූ යම් උගුලක් හෝ ආයුධයක් හෝ මෙවලමක් හෝ පුපුරන ද්‍රව්‍යයක් හෝ විෂ ද්‍රව්‍යයක් සන්තකයේ ඇති හෝ භාවිත කරන;

(ක) යම් ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලක් ඉදි කරන හෝ එසේ ඉදි කරන ලද යම් ගොඩනැගිල්ලක පදිංචි වී සිටින;

(ග) යම් එළිකිරීමක් අලුතින් කරන හෝ ගල් කඩන හෝ කොරල් හෝ මොලියුස් සිප්පි කටු හෝ ලබා ගන්නා නැතහොත් මිනිරන්, මැණික් හෝ ඛනිජ ද්‍රව්‍ය සඳහා කැනීම් කරන හෝ පතල් හෑරීම් කරනු ලබන හෝ හුනුගල් හෝ අඟුරු පුලුස්සන නැතහොත්, බෝර ගසන, වැලි හෝ පස් හෝ ගල් රැස් කරන හෝ ඉවත් කරන හෝ ප්‍රවාහනය කරන;

(ච) යම් ගින්නක් දල්වන හෝ දල්වා තබන හෝ රැගෙන යන හෝ යම් ගින්නක් දැල්වීමට සලස්වන හෝ යම් ගින්නක් දැල්වෙමින් පැවතීමට හෝ පැතිර යාමට ඉඩ හරින;

(ජ) වගා කිරීම හෝ වෙන යම් කාර්යයක් සඳහා යම් ඉඩමක් එළිකරන හෝ එහි පස් කපන හෝ හාරන නැතහොත්, එළිකරන ලද එවැනි යම් ඉඩමක් වගා කරන හෝ එහි පැලක් ඉඳි කරන හෝ ඒ මත වෙන යම් කටයුත්තක් කරන;

(ට) යම් පාරක් ඉදි කරන හෝ එසේ ඉදි කරන ලද යම් පාරක් වෙනස් කරන හෝ ඊට හානි සිදු කරන හෝ එසේ ඉදි කරන ලද යම් පාරක් භාවිත කරන;

(ඩ) යම් බිත්තියක්, අගලක්, ඉවුරක්, වැටක්, කඩුල්ලක්, පීල්ලක්, බඩවැටියක්, නාම පුවරුවක් හෝ සංඥා පුවරුවක් හෝ වෙනත් යම් මායිම් සළකුණක් හානියට භාජනය කරන, වෙනස් කරන, ඉවත් කරන හෝ විරූපී කරන,

යම් තැනැත්තකු, වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු හතක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් විසිදහසකට නොඅඩු සහ රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන්නා වූ දඩයකට

හෝ එකී බන්ධනාගාරගත කිරීම හා දඩය යන දෙකටම හෝ යටත් විය යුතු ය. ඉහත සඳහන් දඬුවමට අතිරේකව සංරක්ෂිත වනයට කරන ලද යම් හානියක් සඳහා අධිකරණය විසින් වන්දියක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය. එම වන්දි මුදල සංරක්ෂිත වනයකට සිදු වූ හානියේ වටිනාකමට නොඅඩු විය යුතු අතර, අධිකරණය විසින් නියම කරන ලද දඩයක් ලෙස ගෙවීමට යටත් කොට අය කිරීම කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් යම් වරදක් කිරීමෙහි ලා ආධාර හෝ අනුබල දෙන හෝ එබඳු වරදක් කිරීමට ඉඩ සලස්වන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට එම වරද කිරීම සම්බන්ධයෙන් නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති එම දඬුවමටම යටත් විය යුතු ය.

(4) වන සංරක්ෂක ජනරාල් විසින්, නියම කරනු ලැබිය හැකි එම නියම හා කොන්දේසිවලට යටත්ව, විද්‍යාත්මක පර්යේෂණ සඳහා ඒ ප්‍රදේශ ඇතුළත වෘක්ෂලතා හා වන සත්ව නිරීක්ෂණයේ නිරතවීම පිණිස—

(අ) නියමිත ආකෘතියෙහි වූ ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද්දා වූ; සහ

(ආ) නියමිත ගාස්තුව ගෙවන ලද්දා වූ,

යම් තැනැත්තකුට අවසර පත්‍ර නිකුත් කරනු ලැබිය හැකි ය.”.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වගන්තිය මෙයින් පරිච්ඡින්න කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 7වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

“රක්ෂිත වනයක තහනම් කරන ලද ක්‍රියා.

7. (1) රක්ෂිත වනයක—

(අ) අයුතු ලෙස ඇතුල්වන හෝ අයුතු ලෙස ඇතුල්වීමට සලස්වන හෝ එහි රැඳී සිටින;

(ආ) ගවයන්ට අයුතු ලෙස ඇතුළුවීමට ඉඩ දෙන හෝ තණකොළ හෝ වෙන යම් පැළෑටියක් කපන, නැතහොත් තණකොළ හෝ පැළෑටි ගවයන්ට කෑමට දෙන;

(ඇ) ගසක් කපා හෙළන හෝ දැව කැපීම හෝ ඇදගෙන යාම කරන, යම් ගසකින් පොතු හෝ කොළ හිතාමතා ගලවා දමන හෝ ගසක් පට්ටම් දමන, කප්පාදු කරන, යුෂ ගන්නා හෝ පුලුස්සන නැතහොත් යම් ගසකට හානි සිදුවන හෝ විනාශයක් සිදුවන යම් ක්‍රියාවක් කරන;

(ඈ) එම වනය තුළ ඇති යම් දිය පහරකට අවහිර කරන හෝ ජලනළ යොදා හෝ වෙනත් ක්‍රමයකින් එම දිය පාරෙන් ජලය ලබා ගන්නා හෝ ජලය විෂ කරන, ජලය අපවිත්‍ර කරන, හෝ එම වනයට කැලි කසළ දැමීමෙන් හෝ වනය තුළට කැලි කසළ බැහැර කිරීමෙන් වන පරිසරය අපවිත්‍ර කරන;

(ඉ) එම වනය තුළ ඇති යම් පැලෑටියක් හෝ එහි යම් කොටසක් ප්‍රවාහනය කරන, ඉවත් කරන, මූලිනුදුරා දමන හෝ විනාශ කරන, නැතහොත් යම් පැලෑටියක් හෝ පැලෑටියක යම් කොටසකට හානි සිදු කරන හෝ යම් පැලෑටියක් විකුණන හෝ විකිණීම සඳහා අනාවෘතව තබන හෝ ප්‍රදර්ශනය කරන හෝ විකිණීම සඳහා අර්පණය කරන;

(ඊ) යම් පක්ෂියකු, සතකු හෝ උරගයකු මරණයට පත් කරන හෝ මරණයට පත් කිරීමට තැත් කරන, ඉවත් කරන,

ප්‍රවාහනය කරන, වෙඩි තබන හෝ තැබීමට තැත් කරන, අල්ලාගනු ලබන, පුඩු අටවා අල්ලාගනු ලබන, ඇල්ලීම සඳහා උගුල් අටවන, හිරිහැර හෝ බාධා කරන නැතහොත් එවැනි යම් පක්ෂියකුගේ, සතකුගේ හෝ උරගයකුගේ යම් කොටසක් විකුණන හෝ විකිණීම සඳහා තබන හෝ විකිණීම සඳහා අර්පණය කරන නැතහොත් එවැනි යම් පක්ෂියකුගේ, සතකුගේ හෝ උරගයකුගේ බිත්තර ගනු ලබන හෝ විනාශ කරනු ලබන නැතහොත් එවැනි යම් පක්ෂියකුගේ, සතකුගේ හෝ උරගයකුගේ වාසස්ථානය විනාශ කරන හෝ ඉවත් කරන;

(උ) ගල් කඩන, හිරිගල් හෝ අඟුරු පුලුස්සන, වන නිෂ්පාදන එකතු කරන හෝ නිෂ්පාදන ක්‍රියාවලියකට භාජනය කරන, කොරල් හෝ මොලියුස් සිප්පි කටු ලබා ගන්නා, මිනිරන්, මැණික් හෝ වෙනත් ආකාරයේ ඛනිජ ලබා ගැනීම සඳහා කැණීම් කරන හෝ පතල් හැරීම කරන, වැලි, පස් හෝ ගල් එකතු කරන හෝ ඉවත් කරන හෝ ප්‍රවාහනය කරන සහ ඒ කාර්යය සඳහා පුපුරණ ද්‍රව්‍ය පාවිච්චි කරන හෝ සන්තකයේ තබා ගනු ලබන;

(ඌ) යම් ගින්නක් දල්වන, දල්වා තබන හෝ දැල්වෙමින් තැබීමට ඉඩ හරින හෝ යම් ගින්නක් ඇවිලෙන්නට සලස්වන හෝ ගින්න පැතිරී යාමට ඉඩ හරින හෝ යම් ගින්නක් රැගෙන යන;

(එ) යම් ගසක් හෝ දැව කපා හෙලන, කපන, ඉරන, සංවර්ධනය කරන හෝ වෙනස් කරන, රැස් කරන, ඉවත් කරන හෝ

ප්‍රවාහනය කරන, වන ද්‍රව්‍ය එකතු කරන, ඉවත් කරන හෝ ප්‍රවාහනය කරන නැතහොත් තම සන්තකයේ, භාරයේ හෝ පාලනයේ තබා ගනු ලබන;

(ඒ) පලංචියක් ඉදි කරන හෝ ලී ඉරන වලක් තනන;

(ඔ) වගා කිරීම සඳහා යම් ඉඩමක් එළි කරන, පස් කපන හෝ යම් ඉඩමක් හාරන හෝ ගොඩනැගිලි සඳහා ඉඩමක් සූදානම් කරන හෝ දැනටමත් එළි කරන ලද යම් ඉඩමක් වගා කරන හෝ යම් ස්ථිර හෝ තාවකාලික පැලක් හෝ ගොඩනැගිල්ලක් ඉදි කරන නැතහොත් එසේ ඉදි කරන ලද යම් ගොඩනැගිල්ලක පදිංචි වී සිටින ; හෝ

(ඕ) යම් පාරක් තනන, දැනටමත් තනන ලද යම් පාරක් වෙනස් කරන හෝ එයට හානි කරන, එසේ තනන ලද යම් පාරක් පාවිච්චි කරන, යම් තාප්පයක්, අගලක්, ඉවුරක්, වැටක්, කඩුල්ලක්, පීල්ලක්, බඩවැටියක්, නාම පුවරුවක්, සංඥා පුවරුවක් හෝ වෙනත් යම් මායිම් සලකුණක් හානියට පමුණුවන, වෙනස් කරන, විරූපී කරන හෝ ඉවත් කරන,

තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු පහක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දසදහසකට නොඅඩු සහ රුපියල් ලක්ෂයක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ, නැතහොත් ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය. ඉහත සඳහන් දඬුවමට අතිරේකව, රක්ෂිත වනයට කරන ලද යම් හානියක් සඳහා, අධිකරණය විසින් වන්දියක් ප්‍රදානය කරනු ලැබිය

හැකි ය. එම වන්දි මුදල රක්ෂිත වනයකට සිදු වූ හානියේ වටිනාකමට නොඅඩු විය යුතු අතර, අධිකරණය විසින් නියම කරන ලද දඩයක් ලෙස ගෙවීමට යටත් කොට අය කිරීම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් යම් වරදක් කිරීමෙහි ලා ආධාර හෝ අනුබල දෙන හෝ එබඳු වරදක් කිරීමට ඉඩ සලස්වන යම් තැනැත්තකු, වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, වරද කිරීම සම්බන්ධයෙන් නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති එම දඬුවමට ම යටත් විය යුතු ය.”.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ සහ 9 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ”. ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ සහ 9 වන වගන්තිය ඉවත් කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තිය එකී වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(2) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

“(2) කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හෝ එසේ කිරීමේ දී පැන නගින යම් නිල කාර්යයන් ඉටු කිරීමේ කාර්යය සඳහා යම් තැනැත්තකුට සංරක්ෂණ වනයකට, රක්ෂිත වනයකට හෝ ගම්බද වනයකට හෝ වෙනත් යම් වනයකට ඇතුළුවීම සඳහා හෝ ඒ තුළ රැඳී සිටීම සඳහා වන සංරක්ෂක ජනරාල්වරයා විසින් යථා පරිදි බලය පවරනු ලැබිය හැකි ය.”

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"සංරක්ෂණ වනයක, රක්ෂිත වනයක හෝ ගම්බද වනයක හැර වෙනත් වනයක දී තහනම් කරන ලද ක්‍රියා.

20. (1) සංරක්ෂණ වනයක්, රක්ෂිත වනයක් හෝ ගම්බද වනයක් හැර වෙනත් වනයක —

(අ) යම් ගසක් කපා හෙලීමේ දී හෝ දැව කිසිවක් කැපීමේ දී හෝ ඇදගෙන යාමේ දී නොසැලකිල්ලෙන් හානි සිදු කරන;

(ආ) යම් ගසකින් පොතු හෝ කොළ ගලවා දමන හෝ යම් ගසක් පට්ටම් දමන, යුෂ ගන්නා හෝ පුලුස්සන හෝ යම් ගසකට අන්‍යාකාරයකින් හානි කරන;

(ඇ) එම වනය තුළ ඇති යම් දිය පහරක් අවහිර කරන හෝ ජලනළ යොදා හෝ වෙනත් ක්‍රමයකින් එම දිය පහරෙන් ජලය ලබාගන්නා හෝ ජලයට විෂ වද්දවන හෝ එම වනයට කැලි කසළ දමා හෝ බැහැර කර, වන පරිසරය අපවිත්‍ර කරන;

(ඈ) ගල් වලවල් කඩන, හිරිගල් හෝ අඟුරු පුලුස්සන හෝ වන නිෂ්පාදන කිසිවක් එකතු කරන හෝ ඒවා යම් නිෂ්පාදන ක්‍රියාවලියකට භාජනය කරන හෝ කොරල් හෝ මොලියුස් සිප්පි කටු ලබා ගන්නා නැතහොත් මිනිරන්, මැණික් හෝ වෙනත් යම් ඛනිජ සඳහා කැණීම් කරන හෝ පතල් හාරන හා ඒ කාර්යය සඳහා පුපුරණ ද්‍රව්‍ය පාවිච්චි කරන හෝ සන්තකයේ තබා ගනු ලබන;

(ඉ) ගවයන්ට තණ කෑමට දෙන, දඩයම් කරන, වෙඩි තබන, මසුන් අල්ලන නැතහොත් උගුල්, පුඩු හෝ තුවක්කු අටවන;

(ඊ) එළිකිරීම් කිසිවක් කරන;

(උ) යම් වනයක් හෝ එවැනි වනයක යම් කොටසක් අනතුරකට ලක්වන ආකාරයට ගිනි තබන හෝ යම් ගින්නක් දල්වා තබන;

(ඖ) කලින් කල බලය දෙනු ලැබිය හැකි පරිදි යම් ඍතු තුළ දී සහ යම් ආකාරයකට හැර, යම් ගින්නක් දල්වන, දල්වා තබන හෝ ගින්දර රැගෙන යන;

(එ) යම් ගසක් හෝ දැව බිම හෙලන, කපන හෝ සංවර්ධනය කරන, එකතු කරන, ඉවත් කරන හෝ ප්‍රවාහනය කරන, නැතහොත් යම් වන නිෂ්පාදනයක් ස්වකීය සන්තකයේ, භාරයේ හෝ පාලනයේ තබා ගන්නා;

(ඒ) පලංචි ඉදි කරන හෝ ලී ඉරන වලක් තනන;

(ඔ) වගා කිරීම සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා යම් ඉඩමක් එළි කරන, පස සකස් කරන,හාරන නැතහොත් දැනටමත් එළි කරනු ලැබ ඇති යම් ඉඩමක් වගා කරන;

(ඕ) පැලක් හෝ ස්ථිර හෝ තාවකාලික යම් ගොඩනැගිල්ලක් ඉදි කරන නැතහොත්, එසේ ඉදි කරන ලද ගොඩනැගිලි කිසිවක පදිංචි වී සිටින;

(ක) යම් පාරක් තනන හෝ එසේ තනන ලද යම් පාරක් පාවිච්චි කරන; හෝ

(ග) යම් නාම පුවරුවක් හෝ සංඥා පුවරුවක් හෝ යම් තාප්පයක්, අගලක්, ඉවුරක්, වැටක්, බාධකයක්, පීල්ලක් හෝ වෙනත් යම් මායිම් සළකුණක් හානියට ලක් කරන, වෙනස් කරන හෝ ඉවත් කරන නැතහොත් වැරදි මායිම් සලකුණු කරන,

තැනැත්තකු, වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ ඒ දඩය හා

බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය. ඉහත සඳහන් දඬුවමට අතිරේකව, එම වනයට කරන ලද යම් හානියක් සඳහා අධිකරණය විසින් වන්දියක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය. එම වන්දි මුදල එම වනයට සිදු වූ හානියේ වටිනාකමට නොඅඩු විය යුතු අතර, අධිකරණය විසින් නියම කරන ලද දඩයක් ලෙස එම ගෙවීම සහ අයකිරීම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් වරදක් කිරීමෙහි ලා ආධාර හෝ අනුබල දෙන හෝ එවැනි යම් වරදක් කිරීමට සලස්වන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, වරද කිරීම සම්බන්ධයෙන් සඳහන් කරනු ලැබ ඇති එම දඬුවමට ම යටත් විය යුතු ය ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය ඉවත් කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ "තත්කාර්ය සඳහා යථා පරිදි බලය පවරන ලද වන නිලධරයකු" යන වචන වෙනුවට "තත්කාර්ය සඳහා යථා පරිදි බලය පවරන ලද වන නිලධරයකු හෝ වෙනත් යම් නිලධරයකු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ IVඅ අලුත් පරිච්ඡේදය සහ 23අ, 23ආ, 23ඇ සහ 23ඈ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය සහ 23අ, 23ආ, 23ඇ සහ 23ඈ යන වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒවා පිළිවෙලින් එකී ප්‍රඥප්තියේ IVඅ පරිච්ඡේදය සහ 23අ, 23ආ, 23ඇ සහ 23ඈ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය:—

## "IV අ පරිච්ඡේදය

### ලියාපදිංචි සහතිකයක් සහ අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා ක්‍රියා පටිපාටිය

ලියාපදිංචි සහතිකයක් සහ අවසර පත්‍රයක් නොමැතිව දැව මඩුවක් පවත්වාගෙන යෑමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම තහනම් බව.

23අ. යම් තැනැත්තකු වෙත නිශ්චිත කාලසීමාවක් සඳහා පවත්වාගෙන යාම සඳහා තත්කාර්ය සඳහා ලිඛිතව අවසර දෙමින් වන සංරක්ෂක ජනරාල්වරයා හෝ වන සංරක්ෂක ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ විසින් නිකුත් කරන ලද ලියාපදිංචි

කිරීමේ සහතික පත්‍රයක සහ අවසර පත්‍රයක අධිකාරය යටතේ මිස, කිසිම තැනැත්තකු විසින් දැව මඩුවක් පවත්වාගෙන යෑමේ ව්‍යාපාරයක් පවත්වාගෙන නොයා යුතු ය.

අවසර පත්‍ර නිකුත් කිරීම

23ආ. (1) නියමිත ගාස්තු ගෙවීමෙන් පසු යම් තැනැත්තකු විසින් තත්කාර්ය සඳහා නියමිත ආකෘතියකින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් වන සංරක්ෂක ජනරාල්වරයා හෝ වන සංරක්ෂක ජනරාල්වරයා විසින් ඒ සඳහා බලය දෙන ලද යම් නිලධරයකු විසින් හෝ නිශ්චිත කොන්දේසිවලට යටත්ව දැව මඩුවක් පවත්වාගෙන යෑමේ ව්‍යාපාරය සඳහා එම ඉල්ලීම කළ තැනැත්තා වෙත බලය දෙමින් ලියාපදිංචි කිරීමේ සහතිකයක් සහ අවසරපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) එකී අවසරපත්‍රය එහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් සඳහා වලංගු විය යුතු අතර නියමිත ගාස්තු ගෙවීමෙන් පසු අලුත් කරනු ලැබිය හැකි ය.

ලියාපදිංචි සහ අවසර පත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම

23ඇ. 23ආ වගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත ලියාපදිංචි සහතිකය සහ අවසරපත්‍රය නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක දී සහ එකී තැනැත්තා විසින් අවසරපත්‍රයේ නියම සහ කොන්දේසි උල්ලංඝනය කරමින් ක්‍රියා කරනු ලැබ ඇති අවස්ථාවක දී, වන සංරක්ෂක ජනරාල්වරයා හෝ වන සංරක්ෂක ජනරාල්වරයා විසින් තත්කාර්ය සඳහා බලය දෙන ලද යම් නිලධරයකු විසින් නියමයක් මගින්, අවස්ථාවෝචිත පරිදි, එකී ලියාපදිංචිය එහි නිශ්චිතව දක්වන ලද යම් කාලසීමාවක් සඳහා අත්හිටුවමින් හෝ එකී ලියාපදිංචිය අවලංගු කරමින් නියමයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

දණ්ඩන.

23ඈ. (1) 23අ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් දැව මඩුවක් පවත්වාගෙන යාමේ ව්‍යාපාරයක් කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී—

(අ) පොළවට සවි කරන ලද හෝ වෙනත් ආකාරයක දැව ඉරීමේ යන්ත්‍රයක් මගින් යම් දැව ඉරීමේ ව්‍යාපාරයක යෙදී සිටින හෝ දැව අලෙවි සැලක් හෝ දැව පදම් කිරීමේ සහ සකස් කිරීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම හෝ සම්බන්ධයෙන් වන විට, ඔහු රුපියල් දසදහසකට නොඅඩු සහ අවුරුදු දෙකක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ යටත් විය යුතු ය ; සහ

(ආ) එම වරද (යාන්ත්‍රික හෝ වෙනත් ආකාරයක) වඩු මඩුවක්, ගෘහ භාණ්ඩ සාප්පුවක් නැතහොත් දැව උපකරණ හෝ ඒවායේ කොටස් හෝ දැව භාණ්ඩයන් හෝ අලෙවි කරනු ලබන අලෙවි සැලක් හෝ දර මඩුවක් හෝ පවත්වාගෙන යාමේ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, ඒ තැනැත්තා මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් පනස්දහසක් නොඉක්මවන්නා වූ දඩ මුදලකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු වූ තැනැත්තකු එම වරදේ දින සිට සති හයක කාලයකට පසුව එම වරද දිගටම සිදු කරනු ලබන අවස්ථාවක දී, අධිකරණය වෙත වන සංරක්ෂක ජනරාල් හෝ වන සංරක්ෂක ජනරාල් විසින් බලය දෙන ලද යම් තැනැත්තකු හෝ විසින් එම ව්‍යාපාරය හෝ වෙළෙඳාම වසා දැමීම සඳහා ඉල්ලීමක් කිරීමේ දී, එකී තැනැත්තා 23අ වගන්තියට අනුව ලියාපදිංචි කිරීමේ සහතිකයක් සහ අවසරපත්‍රයක් ලබා ගන්නා කාලය තෙක් සහ එහි නිශ්චිතව සඳහන් නියම සහ කොන්දේසි සමග එකඟව ක්‍රියා කරනු ලබන තෙක් එම ව්‍යාපාරය හෝ වෙළෙඳාම වසා දැමීම කළයුතු බවට අධිකරණය විසින් නියෝග කරනු ලැබිය හැකි ය.

(3) එකී තැනැත්තා විසින් එම වසා දැමීම සඳහා වූ නියෝගයට එකඟව ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක සහ දැව මඩුවක් පවත්වාගෙන යෑමේ ව්‍යාපාරයෙහි දිගටම නියැලී සිටින අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින්, එම නියෝගයෙන් පසුව ඔහු විසින් දැව ව්‍යාපාරය දිගටම පවත්වාගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන් දහස නොඉක්මවන මුදලක් ගෙවන ලෙසට සහ එම නියෝගය නිකුත් කොට දින තුනකට කලින් දිනයක් නොවන සහ දින හතක් නොඉක්මවන දිනයක දී එම දැව මඩුව පවත්වාගෙන යෑමේ ව්‍යාපාර සිදු කරනු ලබන පරිශ්‍රය වසා දැමීම සඳහා පිස්කල්වරයාට නියම කිරීම සහ බලය ලබා දීම ද සඳහා නියෝග කරනු ලැබිය යුතු ය. එකී පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලබන දැව මඩු පවත්වාගෙන යෑමේ ව්‍යාපාරයට එකී පිස්කල්වරයා හෝ ඔහු විසින් බලය දෙන ලද පොලිස් නිලධරයකු විසින්, අවශ්‍ය යයි පිස්කල්වරයා විසින් සලකනු ලබන සහායකයන් ද සමග ඇතුළුවීම සඳහා එකී නියෝගය ප්‍රමාණවත් අධිකාරි බලයක් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "ගොඩබිමෙන් හෝ ජලයෙන්" යන වචන වෙනුවට "ගොඩබිමෙන්, ගුවනින් හෝ ජලයෙන් " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි (අ) වන ඡේදයේ "ප්‍රවාහනය" යන වචනය යෙදී ඇති සෑම ස්ථානයකටම ඒ වෙනුවට "ප්‍රවාහනය කිරීම හෝ ඉවත් කිරීම" යන වචන අදේශ කිරීමෙන් ;

(3) එහි (ජ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(ජ) දැව සහ වන නිෂ්පාදන ආනයනය කිරීම හා අපනයනය කිරීම විධිමත් කිරීම හා ගාස්තු පැනවීම ;

(ට) තත්කාර්ය සඳහා වන සංරක්ෂක ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ මිස දැව හෝ වන නිෂ්පාදන ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම තහනම් කිරීම ;

(ඩ) යම් නිශ්චිත දැව හෝ වන නිෂ්පාදන අපනයනය කිරීම තහනම් කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 24අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ප්‍රධාන ප්‍රඥප්තියේ 24අ වගන්තිය වශයෙන් එය බලපැවැත්විය යුතු ය:—

රේගු ආඥාපනත අදාළ කිරීම.

24අ. (1) රේගු දෙපාර්තමේන්තුවේ නිලධරයකු විසින්, බඩු පටවන වරායේ දී, ශ්‍රී ලංකාවේ අපනයනය කරනු ලබන සියලු දැව හෝ වන නිෂ්පාදන සම්බන්ධයෙන්, කලින් කල නියම කරනු ලබන යම් අනුප්‍රමාණවලට අනුව, ගාස්තුවක් අය කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) මේ වගන්තිය (235 වන අධිකාරිය වූ) රේගු ආඥාපනතේ කොටසක් වශයෙන් බලාත්මක විය යුතු අතර, ඒ ආඥාපනතේ විධිවිධාන ඒ අනුව අදාළ කොට ගත යුතු ය.”.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ —

(අ) “රුපියල් පන් දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොඅඩු සහ මාස හයකට නොවැඩි සිර දඬුවමකට හෝ” යන වචන වෙනුවට “රුපියල් දසදහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු හතරක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ ” යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම වගන්තියේ (2) වන අතුරු විධානයේ “රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොඅඩු සහ අවුරුදු දෙකකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට හෝ” යන වචන වෙනුවට “රුපියල් පහළොස් දහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂ පනස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු හතරකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට හෝ” යන වචන ආදේශ කිරීමෙන් ;”;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ —

(අ) “මාස හයකට නොඅඩු හා අවුරුදු පහක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට” යන වචන වෙනුවට, “අවුරුදු පහක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් විසිදහසකට නොඅඩු සහ රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකටම හෝ” යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ අතුරු විධානයේ, "රුපියල් දෙදහස් පන්සියයකට නොඅඩු සහ රුපියල් දසදහසක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ මාස තුනකට නොඅඩු සහ අවුරුදු එකක් නොඉක්මවන්නා වූ බන්ධනාගාරගත කිරීමකට" යන වචන වෙනුවට "අවුරුදු දෙකක් නොඉක්මවන්නා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසක් නොඉක්මවන්නා වූ දඩයකට " යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (2අ) උපවගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"(2අ) තමා අයිතිකරු වන හෝ තම සන්තකයේ ඇති යම් මෙවලමක්, වාහනයක් හෝ යන්ත්‍රයක් මේ පරිච්ඡේදය යටතේ වූ වරදක් කිරීම සඳහා පාවිච්චි කිරීමට ඉඩ සලස්වන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරද කරනු ලැබූ විට, අවුරුදු දෙකක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දසදහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය."; සහ

(4) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "මේ පරිච්ඡේදයෙහි" යන වචන වෙනුවට "මේ පරිච්ඡේදයෙහි හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තිය එකී වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(2) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියෙහි, "ආණ්ඩුවේ ඒජන්ත" යන වචන දැක්වෙන කවර තැනක වුව ද, ඒ වචන වෙනුවට "දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් හෝ අඩවි වන නිලධරයකුගේ තනතුරට අඩු නොවන තනතුරක වන නිලධරයකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(2) යම් දැව හෝ වන නිෂ්පාදන ප්‍රවාහනය කිරීම සඳහා ඒ දැව හෝ වන නිෂ්පාදන පෞද්ගලික දේපළකින් ලබා ගත්තේ යයි කියමින්, අවසර පත්‍රයක් සඳහා ඉල්ලීමක් කරන සෑම තැනැත්තකු ම, ඒ දැව හෝ වන නිෂ්පාදන මෙම ආඥාපනත යටතේ ඇති විධිවිධානවල ප්‍රකාශිත වනයකින් හෝ රජයේ ඉඩමකින් ලබා ගත් බව ඔප්පු කිරීම සඳහා, විරුද්ධව සාක්ෂි ඇත්නම්, වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට 25 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් එම දඬුවමටම යටත් විය යුතු ය. එම තැනැත්තාට එරෙහිව සාක්ෂි වශයෙන් ඒ ඉල්ලුම් පත්‍රය අධිකරණයක් විසින් ආවේශ්‍ය කරගනු ලැබිය යුතු ය.".

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි "දැව කිසිවක් ගෙන යාමේ දී නතර කර, පරීක්ෂා කිරීමේ බලය" යන වචන වෙනුවට "යම් වාහනයක් දැව හෝ වන නිෂ්පාදන ප්‍රවාහනය හා ඉවත් කිරීම සඳහා යොදා ගනු ලබන්නේ දැයි නිසැකවම දැන ගැනීමේ කාර්යය සඳහා එම වාහනය ගමන් ගෙන සිටින විට නතර කිරීමේ සහ පරීක්ෂා කිරීමේ බලය" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය, එහි (අ), (ආ) සහ (ඇ) ඡේද ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) යම් වාහනයක් නතර කිරීම සඳහා හෝ එවැනි වාහනයක් නතර කිරීමට සැලැස්වීම සඳහා අවශ්‍ය විය හැකි යම් නියමයක්, විධානයක්, සංඥාවක් දීම හෝ යම් උපක්‍රම යෙදීම නැතහොත් යම් පියවර ගැනීම ;

(ආ) යම් වාහනයක් පරීක්ෂා කිරීමට හා සෝදිසි කිරීමට, රඳවා තබා ගැනීම ;

(ඇ) වාහනයක් තුළ සොයාගනු ලැබූ දැව හෝ වන නිෂ්පාදන අත්අඩංගුවට ගැනීම සහ vii වන පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි දැව සහ වන නිෂ්පාදන සම්බන්ධව ක්‍රියා කිරීම.”.

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියෙහි “රුපියල් පන් දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනකට නොඅඩු සහ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ” යන වචන වෙනුවට “අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දසදහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ ” යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) “දැව” යන වචනය වෙනුවට, ඒ වචනය, ඒ වගන්තියේ දැක්වෙන කවර තැනක වුව ද, “දැව සහ වන නිෂ්පාදන” යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

“(2) මේ වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී යම් වන නිලධරයකුට හෝ පොලිස් නිලධරයකුට, බාධා කරන හෝ යම් ආකාරයකින් ඔවුන්ගේ කටයුතුවලට මැදිහත් වන, නැතහොත්, මේ වගන්තිය යටතේ බලය ක්‍රියාත්මක කිරීමේ දී ඊට බාධා කිරීමට හෝ මැදිහත්වීමට සලස්වන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු පහක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් විසිදහසකට නොඅඩු සහ රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ “රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකින් හෝ මාස තුනකට නොඅඩු සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු ය” යන වචන වෙනුවට

"අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකින්" රුපියල් දසදහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂයකට වැඩි නොවන දඩයකින් හෝ දඬුවම් කරනු ලැබිය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"දැව හෝ වන නිෂ්පාදන හෝ වාහන තහනමට ගැනීමේ බලය

37. (1) යම් වන නිලධරයකු හෝ පොලිස් නිලධරයකු විසින් යම් පරීක්ෂණයකින් පසුව දැව හෝ වන නිෂ්පාදන සම්බන්ධයෙන් වරදක් කරනු ලැබ ඇතැයි හෝ කරනු ලබන්නේ යයි විශ්වාස කිරීමට තරම් තමාට හේතු ඇත්නම්, ඒ දැව හෝ වන නිෂ්පාදන එවැනි යම් වරදක් කිරීමට යොදා ගනු ලැබූ සියලු මෙවලම්, වාහන සහ සියලු උපකරණ, ගවයන් සහ යන්ත්‍ර ද සමග තහනමට ගෙන රඳවා තබාගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වන නිලධරයා හෝ පොලිස් නිලධරයා විසින්, ඒ දැව හෝ වන නිෂ්පාදන, වරද කිරීම සඳහා යොදා ගනු ලැබූ සියලු මෙවලම්, වාහන, උපකරණ, ගවයන්, යන්ත්‍ර සහ අදාළ ලේඛන ද සමග වැඩ කරන දවස් හතක් ඇතුළත ආසන්නතම අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, තහනමට ගනු ලැබූ හෝ රඳවා තබාගත් එම දැව හෝ වන නිෂ්පාදන, ඒවා එසේ තහනමට අල්වා රඳවා තබාගත් ස්ථානයේ සිට ඉවත් කොට අධිකරණයට ඉදිරිපත් කිරීමේ දී දැරිය යුතු වියදම, තහනමට ගත් ද්‍රව්‍යවල වටිනාකම ඉක්මවා යන මුදලක් දැරීමට සිදුවන බව ද ඒ නිසා එය කිසිසේත් ප්‍රායෝගික නොවන බව ද පුද්ගලිකව දන්නා වන සංරක්ෂක ජනරාල් හෝ අඩවි වන නිලධරයකුගේ තනතුරට අඩු නොවන නිලධරයකුගේ හෝ උප පොලිස් පරීක්ෂකවරයකුගේ තනතුරට අඩු

නොවන යම් පොලිස් නිලධරයකුගේ, අත්සන යටතේ වූ සහතිකයක් එහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂි වශයෙන් සලකනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38අ වගන්තිය සංශෝධන කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38අ වගන්තිය, ඒ වගන්තියේ "මෝටර් වාහනයක්, යන්ත්‍රයක්, උපකරණයක්, පහුරක්, බත්තලක්, ට්‍රේලරයක්" යන වචන වෙනුවට “වාහනයක්, යන්ත්‍රයක්, ගවයන් සහ උපකරණයක්” යන වචන ආදේශ කිරීමෙන් ද, “37 වන වගන්තිය යටතේ තහනමට ගනු ලැබූ” යන වචන වෙනුවට “තහනමට ගනු ලැබූ හෝ 37 වන වගන්තිය යටතේ සහතිකයක් දෙනු ලැබූ” යන වචන ආදේශ කිරීමෙන් ද, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

“(1) යම් තැනැත්තකු, යම් වන වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ අවස්ථාවක—

(අ) රජයේ දේපළ නොවන්නා වූ ද, එවැනි වරදක් ඒ සම්බන්ධයෙන් සිදු කරනු ලැබුවා වූ ද, සියලු දැව හෝ වන නිෂ්පාදන ; සහ

(ආ) ඒ වරද සිදු කිරීමෙහි ලා යොදා ගනු ලැබූ සියලු මෙවලම්, වාහන, උපකරණ, ගවයන් සහ යන්ත්‍ර,

ඒ වරද සඳහා නිශ්චිත වෙනත් යම් දඬුවමකට අතිරේකව, වරදකරු බවට පත් කරන ලද මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාවක් මගින් රාජසන්තක කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, යම් අවස්ථාවක දී, ඒ වරද සිදු කිරීමෙහි යොදා ගනු ලැබූ මෙවලම්, වාහන, උපකරණ, ගවයන් සහ යන්ත්‍රවල අයිතිකරු තුන්වන පාර්ශ්වයක් වන විටෙක, වරද කිරීමෙහි ලා අවස්ථාවෝචිත පරිදි ඒ මෙවලම්, වාහන, උපකරණ, ගවයන් සහ යන්ත්‍ර පාවිච්චි කිරීම වළක්වාලීම සඳහා සියලු පූර්වාරක්ෂක ක්‍රියා මාර්ග තමා විසින් යොදා ගනු ලැබූ බවට අධිකරණය සෑහීමට පත්වන පරිදි එකී අයිතිකරු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, රාජසන්තක කිරීමේ ආඥාවක් කරනු නොලැබිය යුතු ය.”.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රඥප්තියේ 40ආ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 40ආ වගන්තිය ඇතුළත් කිරීම.

"වන වරදක් සම්බන්ධයෙන් වරද පිළිගන්නා හෝ වරදකරු වන තැනැත්තකු 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 433අ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු බව.

40ආ. වන වරදක් සම්බන්ධයෙන් වරද පිළිගන්නා හෝ වරදකරු වන යම් තැනැත්තකුට හෝ ඒ තැනැත්තා සම්බන්ධයෙන් 1990 අංක 12 දරන පනතින් සංශෝධිත 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 433අ වගන්තියේ (1) වන හා (2) වන උපවගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.".

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) මේ ආඥාපනතේ විධිවිධාන අදාළ වන යම් වනයක, යම් මායිම් ලකුණක් හෝ මායිම් කණුවක් වෙනස් කරන, විනාශ කරන, විරූප කරන හෝ කූට ලෙස සකස් කරන හෝ එකී වනය පිළිබඳව ව්‍යාජ පිඹුරක් පිළියෙල කරන හෝ එවැනි යම් ව්‍යාජ පිඹුරක් ඉදිරිපත් කරන ; නැතහොත්

(ඈ) නීති විරෝධී ලෙස මුද්‍රා තැබූ දැව හෝ හොර මුද්‍රා සහිත දැව තම සන්තකයේ හෝ භාරයේ තබා ගනු ලබන.";

(2) "මාස හයකට නොඅඩු සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසකට නොවැඩි

දඩයකට හෝ" යන වචන වෙනුවට, "අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන් දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ"යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) මේ වගන්තිය යටතේ අත්අඩංගුවට ගැනීමක් කරන සෑම නිලධරයකු විසින් ම, අනවශ්‍ය ප්‍රමාදයක් නොමැතිව, අත්අඩංගුවට ගනු ලැබූ තැනැත්තා, චූදිතයාට චෝදනා කරනු ලැබූ වරද දැක්වෙන ප්‍රකාශයක් ද සමග ආසන්නත ම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කළ යුතු ය. පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින්, අත්අඩංගුවට ගනු ලැබූ තැනැත්තා වහාම ආසන්නත ම මහෙස්ත්‍රාත්වරයා වෙත ගෙන යා යුතු ය. නැතහොත් යවනු ලැබිය යුතු ය :

එසේ වුව ද, මේ වගන්තිය යටතේ යම් තැනැත්තකු අත්අඩංගුවට ගැනීම, වන නිලධරයකු විසින් හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් හෝ කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා පිළිවෙලින් අඩවි වන නිලධරයකු වෙත හෝ අඩවි වනජීවී නිලධරයකු වෙත ගෙන යා යුතු අතර එකී නිලධරයා විසින් එසේ අත්අඩංගුවට ගනු ලැබූ තැනැත්තා ආසන්නතම මහෙස්ත්‍රාත්වරයා වෙත ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වගන්තිය සංශෝධනය කිරීම.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "අවුරුදු එකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් විසිපන් දහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ " යන වචන වෙනුවට "අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"දැව ආදිය රජයට අයත් බව පූර්ව නිගමනය කිරීම.

52. මේ ආඥාපනත යටතේ වූ නීති කෘත්‍ය කිසිවක දී හෝ මේ ආඥාපනත යටතේ කරන ලද යම් දෙයක ප්‍රතිඵලයක් වශයෙන්, යම් දැව හෝ වන නිෂ්පාදන කිසිවක් රජයේ දේපළ දැයි ප්‍රශ්නයක් පැන නගින අවස්ථාවක, ඒ දැව හෝ වන නිෂ්පාදන, පටහැනි කරුණු ඔප්පු කරන තෙක් රජයේ දේපළ බවට පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.".

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය, ඒ වගන්තියේ "අපරාධ නඩු විධාන සංග්‍රහය" යන වචන දැක්වෙන කවර තැනක වුව ද ඒ වචන වෙනුවට "1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනත" යන වචන ද, "XVI වන පරිච්ඡේදය" යන ඉලක්කම් සහ වචන දැක්වෙන කවර තැනක වුව ද, ඒ වෙනුවට "XV වන පරිච්ඡේදය යන ඉලක්කම් සහ වචන ද පිළිවෙලින් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම.

33. ප්‍රධාන ප්‍රඥප්තියේ 53අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 53අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"රජයේ ඉඩම්වලින් නෙරපීම.

53අ. යම් තැනැත්තකු විසින් අවස්ථාවෝචිත පරිදි, යම් සංරක්ෂිත වනයක, රක්ෂිත වනයක, ගම්බද වනයක හෝ ඒ කවර හෝ වර්ගයකට අයත් නොවන වර්ගයක වනයක යම් කොටසක් නීති විරෝධී ලෙස එළි කරන හෝ අල්ලා ගනු ලබන හෝ නීති විරෝධී ලෙස හෝ අනවසරයෙන් සතුකරගෙන ඇති අවස්ථාවක, ඒ තැනැත්තා වරදකට වරදකරු වන අතර, ඔහු ඒ වරද සම්බන්ධයෙන් වූ දඬුවමට අතිරේකව, ඒ ඉඩමෙන් නෙරපීමට යටත් විය යුතු ය.

තව ද, 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එවැනි යම් නෙරපීමක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. ඒ පනතේ ප්‍රාදේශීය ලේකම් සම්බන්ධයෙන් කෙරෙන සෑම සඳහනක් ම, ඒ ඉඩම පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය වන නිලධරයා සම්බන්ධයෙන් කරනු ලබන සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේද ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්, ඒ වගන්ති මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

“(අ) එක් එක් අලියකු හෝ මීහරකකු සඳහා රු. 15,000.00;

(ආ) එක් එක් වස්සකු, බූරුවකු, ඌරකු, බැටළුවකු, බැටළු පැටවකු, එළුවකු හෝ එළු පැටවකු සඳහා රු. 3,000.00;

(ඇ) ඉහත සඳහන් සතුන් හැර, එක් එක් ගවයකු සඳහා රු. 7,500.00.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

“(ඇ) මේ ආඥාපනතේ 24 වන, 27 වන, 37 වන හෝ 48 වන වගන්තිවල කාර්යය සඳහා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ යම් සේවා නියුක්තකයකු හෝ නිලධරයකු විසින් වන නිලධරයකුගේ කර්තව්‍ය ඉටු කිරීමට;

(ඈ) මේ ආඥාපනතේ 27 වන, 37 වන හෝ 48 වන වගන්තිවල කාර්යය සඳහා, දිසා ඉඩම් නිලධරයකු, ඉඩම් නිලධරයකු, කච්චේරි මිනින්දෝරුවකු, ග්‍රාම නිලධරයකු හෝ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ජනපද නිලධරයකු විසින් වන නිලධරයකුගේ කර්තව්‍ය ඉටු කිරීමට;

(ඉ) මේ ආඥාපනතේ 24 වන, 27 වන, 28 වන, 30 වන, 31 වන, 32 වන, 37 වන හෝ 48 වන වගන්තිවල කාර්යය සඳහා, දිසා ලේකම්වරයකු, ප්‍රාදේශීය ලේකම්වරයකු හෝ සහකාර ප්‍රාදේශීය ලේකම්වරයකු විසින් වන නිලධරයකුගේ කර්තව්‍ය ඉටු කිරීමට.".

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය, මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (එ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඒ) නිශ්චිත දැව සහ වන නිෂ්පාදන සඳහා මේ ආඥාපනතේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අවසර පත්‍ර නිකුත් කිරීමේ බලය දී ඇති නිලධරයන් කාණ්ඩ නම් කිරීමේ සහ පත් කිරීමේ බලය සහ අදාළ අනුරූපී ප්‍රදේශය නිශ්චිතව දැක්වීමේ බලය ;

(ඔ) 24 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ජ) සහ (ඩ) වගන්තිවලට අනුකූලව, දැව හා වන නිෂ්පාදන කාණ්ඩ වර්ග කිරීමේ බලය.".

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"නියෝග. 64. (1) මේ ආඥාපනත මගින් නියම කළ යුතු ලෙස නියමිත කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට මේ ආඥාපනත මගින් බලය පවරා ඇත්තේ හෝ නියම කර ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද, එම කාරණා සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොවන පරිදි අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) මේ ආඥාපනත මගින් පවරා ඇති හෝ පනවා ඇති බලතල හෝ කාර්යය ක්‍රියාත්මක කළ යුතු හෝ ඉටු කළ යුතු වන නිලධරයා හෝ වන නිලධරයන් ප්‍රකාශයට පත් කිරීම ;

(ආ) වන දෙපාර්තමේන්තු අරමුදල පිහිටුවා ඇත්තේ යම් කාර්යය සඳහා ද, එම කාර්යය සඳහා එම අරමුදල පාලනය කිරීම සහ පරිපාලනය කිරීම ;

(ඇ) පහත සඳහන් මුදල් හෝ ඉන් යම් කොටසක් එකී අරමුදලට ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම :—

(i) මේ ආඥාපනත යටතේ සිදු කරන ලද වැරදි සඳහා වන්දි මුදල් වශයෙන් ලැබුණ මුදල් ද, අධිකරණය විසින් පනවන ලද දඩ මුදල්වලින් ලැබුණ මුදල් සහ රාජසන්තක කරන ලද වාහන විකිණීමෙන් ලැබෙන මුදල්;

(ii) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් භාරගනු ලබන ක්‍රියාකාරකම් හරහා ලැබෙන මුදල් ; සහ

(iii) ආණ්ඩුව, යම් රාජ්‍ය හෝ පෞද්ගලික සංස්ථා හෝ යම් පුද්ගලයකු විසින් ආධාර වශයෙන් අරමුදලට දෙනු ලබන මුදල්.

(ඈ) නියෝගවල නිශ්චිතව දක්වනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව පහත සඳහන් මුදල් අරමුදලින් ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම :—

(i) (28 වන පරිච්ඡේදය වූ) තොරතුරු දැනුම් දෙන්නන්ට ත්‍යාග ලබාදීමේ ආඥාපනත යටතේ තොරතුරු ලබා දෙන්නන්ට සහ වන නිලධරයන්ට ප්‍රදානය කරනු ලබන ත්‍යාග ;

(ii) මේ ආඥාපනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී සහ කිරීමේ දී යම් වන නිලධරයන්ට, පොලිස් නිලධරයන්ට හෝ වෙනත් නිලධරයන්ට සිදුවන ශාරීරික තුවාල සඳහා වන්දි ගෙවීම ; හෝ

(iii) එවැනි තුවාල සිදුවීම්වලින් මරණය සිදුවන අවස්ථාවක ඔවුන්ගේ උරුමක්කාරයන්ට වන්දි ගෙවීම ;

(iv) මේ ආඥාපනතේ කාර්ය සඳහා අධිකරණවලට පැමිණීම සඳහා යථා පරිදි දැරීමට සිදුවන ගමන් වියදම්;

(v) නීති විරෝධී ලෙස දැව කැපීම හෝ නීති විරෝධී ලෙස දැව ප්‍රවාහනය කිරීම වැළැක්වීම සඳහා වැටලීම් සිදු කිරීමේ දී දැරීමට සිදුවන වියදම් ; සහ

(vi) මේ ආඥාපනත යටතේ තම කාර්ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට වන නිලධරයන්ට හැකිවන පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීම ඇතුළු, වන ආරක්ෂක කටයුතුවල දී දැරීමට සිදුවන වියදම් ;

(ඉ) වන සංරක්ෂක දෙපාර්තමේන්තුවේ වන නිලධරයන්ගේ යහපත සඳහා, රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම ;

(ඊ) මෙම ආඥාපනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව අය කිරීම ද, එම ගාස්තුව ගෙවීමේ ආකාරය සහ අයකර ගැනීමේ ආකාරය ද ඇතුළුව, මේ ආඥාපනතේ විධිවිධාන සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කිරීම ;

(උ) සංරක්ෂිත වනයක් හෝ රක්ෂිත වනයක් හෝ ගම්බද වනයක් හෝ නොවන්නා වූ වනයක් තුළ පහත දක්වා ඇති කරුණු සම්බන්ධයෙන්, එනම් :—

(i) වනය තුළ කරගෙන යාමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අය හෝ ගාස්තු අයකිරීම ;

(ii) ඒවායේ කාර්ය, විෂය පථය සහ ප්‍රමාණය දක්වමින් කළමනාකරණ ගිවිසුම් පිළියෙල කිරීමේ කාර්ය පටිපාටිය ඇතුළුව ප්‍රජාවගේ ද, පුද්ගලික අංශවල ද සහයෝගයෙන්, තත්ත්වයෙන් පහත වැටී ඇති වන ප්‍රදේශ සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීමේ කාර්ය සඳහා කරගෙන යා යුතු ක්‍රියාකාරකම් ;

(iii) එවැනි ගිවිසුම්වලට ඇතුළත්වීම, එකී ගිවිසුම් අවලංගු කිරීම, කොන්දේසි පැනවීම, ගාස්තු අයකිරීම සමග එකී වන කළමනාකරණය සම්බන්ධයෙන් හටගන්නා ආරවුල් සමථයකට පත් කිරීම සඳහා ක්‍රමෝපාය සම්පාදනය කිරීම;

(iv) කළමනාකරණ හවුල්කරුවන් හෝ උනන්දුව දක්වන්නන් අතර ප්‍රතිලාභ හවුලේ බුක්ති විඳීමේ යාන්ත්‍රණයක් සකසා වර්ධනය කිරීම;

(v) යම් ප්‍රාදේශීය ප්‍රජාවක් විසින් එකී වනය තුළ ඇති වන නිෂ්පාදන භාවිත කිරීමට අවසර දීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ එයට අදාළ කොන්දේසි ;

(vi) වනය තුළ සිදුවන කවර හෝ ක්‍රියාකාරකම්වලට අදාළ කොන්දේසි;

(vii) වනය තුළ යම් විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීමට අවසර දෙනු ලැබිය යුතු ප්‍රදේශ සහ ඒවා යටත් ලැබිය යුතු කොන්දේසි.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලබන දින සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු එක් මසක් ඇතුළත අනුමතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) එසේ අනුමත නොවූ සෑම නියෝගයක් ම එය යටතේ කලින් කරනු ලැබූ කිසිවකට අගතියක් නොමැතිව එම අනනුමතයේ දින සිට, අවලංගු වූ සේ සලකනු ලැබිය යුතු ය.

(6) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 64අ සහ 64ආ යන වගන්ති ඇතුළත් කිරීම.

38. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එකී වගන්ති එම ප්‍රඥප්තියේ 64අ සහ 64ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

"දඩයේ කොටසක් අරමුදලට ගැනීම සඳහා අධිකරණය විසින් විධාන කළ යුතු බව.

64අ. අධිකරණය විසින් මේ පනත යටතේ දඬුවම් පැනවීමේ දී—

(අ) එම දඬුවම දඩයක් පැනවීම සම්බන්ධයෙන් වන විට එම දඩ මුදලින් භාගයකට වඩා අඩු නොවන මුදලක් ; සහ

(ආ) එම දඬුවම මගින් වරද සිදු කිරීම හා සම්බන්ධව භාවිත කරන ලද වාහන රාජසන්තක කිරීම සඳහා විධිවිධාන සලස්වනු ලබන අවස්ථාවක

එම වාහනය විකිණීමෙන් ලැබෙන මුදල්වලින් හරි අඩකට නොඅඩු මුදලක්,

මේ පනතේ විධිවිධාන යටතේ පිහිටුවනු ලැබූ වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අරමුදලට බැර කරන ලෙස විධාන කරනු ලැබිය හැකි ය.

"අරමුදලේ මුදල් යොදවනු ලැබිය යුතු කාර්ය.

64ආ. (1) යම් වන නිලධරයකු, අවස්ථාවෝචිත පරිදි යම් අබලතාවයකට, නොහැකියාවකට හෝ මරණයට පත් වූයේ—

(අ) එකී නිලධරයා රාජකාරියේ නියුක්තව සිටිය දී සිදු වූ ; හෝ

(ආ) එකී නිලධරයා—

(i) රාජකාරියට වාර්තා කිරීම සඳහා ඔහුගේ නිවාසස්ථානයේ සිට සේවාස්ථානය කරා යන අවස්ථාවේ දී; හෝ

(ii) රාජකාරියෙන් පසු සේවාස්ථානයේ සිට නිවාසස්ථානය කරා යන අවස්ථාවේ දී; නැතහොත්

(ඇ) එකී නිලධරයා රාජකාරියේ නියුක්තව සිටින අතරතුර දී නොව, ඔහුගේ සාමාන්‍ය රාජකාරියේ විෂය පථයට ඇතුළත් යම් කටයුත්තක් ඉටු කිරීමේ දී සිදු වූ ;

(ඈ) එකී නිලධරයා ඔහුගේ රාජකාරිය ඉටු කිරීමේ දී සිදු කරනු ලැබූ යම් ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ ; හෝ

(ඉ) එකී නිලධරයා ඔහුගේ රාජකාරිය ඉටු කිරීමේ දී ගන්නා ලද යම් ක්‍රියා මාර්ගයක අවස්ථානුගත කරුණක් මගින් හෝ එම ක්‍රියා මාර්ගය හේතුවෙන් පැන නගින යම් පළිගැනීමේ ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ,

තුවාල හේතුවෙන් වන විටක, එසේ පූර්ණ අබලතාවකට හෝ අර්ධ අබලතාවකට පත් වූ හෝ තාවකාලික නොහැකියාවකට පත් වූ වන නිලධරයාට වන්දි ප්‍රදානය කිරීම සඳහා නැතහොත් වන නිලධරයා මියගිය විටක ඔහුගේ නෛතික උරුමකරුවන්ට වන්දි ප්‍රදානය කිරීම සඳහා අරමුදල් භාවිත කළ යුතු ය.

(2) වන නිලධරයකුගේ අබලතාවය, නොහැකියාව හෝ මරණය සම්බන්ධයෙන්, මේ වගන්තියේ පහත විධිවිධාන යටතේ සාදනු ලබන නියෝගවලට අනුකූලව ප්‍රදානය කරනු ලබන යම් වන්දි මුදලක්, එවැනි අබලතාවන්, නොහැකියාවන් හෝ මරණය සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හෝ ඒ සඳහා ආදාළ වනු ලබන වෙනත් අන් ලිඛිත නීතියක් හෝ යටතේ ප්‍රදානය කරනු ලබන දඩයකට අමතරව විය යුතු ය.”.

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 65 වන වගන්තිය ආදේශ කිරීම.*

“රීති. 65. මේ ආඥාපනත මගින් නියමිත කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රීති සෑදීම හෝ අනුමත කිරීම කරනු ලැබිය හැකි ය. එම රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.”.

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය, “රක්ෂිත වනයක හෝ ගම්බද වනයක” යන වචන වෙනුවට, “සංරක්ෂිත වනයක හෝ රක්ෂිත වනයක හෝ ගම්බද වනයක හෝ එම වර්ගවලට ඇතුළත් නොවන යම් වනයක” යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. *ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**41.** ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 67අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— *ප්‍රධාන ප්‍රඥප්තියට 67අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

"දැනුම් දෙන්නන් සඳහා තෑගි.

67අ. යම් තැනැත්තකු විසින්—

(අ) මේ ආඥාපනත යටතේ යම් වරදකට අදාළව ස්වේච්ඡාවෙන් තොරතුරු සපයනු ලබන ; හෝ

(ආ) යම් වනයක් ඇතුළත හටගන්නා යම් ගින්නක් නිවීමෙහි ලා ස්වේච්ඡාවෙන් සහාය සපයනු ලබන,

අවස්ථාවක, වනය ආරක්ෂා කිරීම සඳහා තෑගි වශයෙන් වන සංරක්ෂණ අරමුදලින් ඒ තැනැත්තාට ගෙවිය යුතු මුදල් ප්‍රමාණය නිශ්චිත නිර්ණායකවලට අනුකූලව වන සංරක්ෂක ජනරාල් විසින් නිශ්චය කිරීම නීත්‍යානුකූල විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය ඉවත් කිරීම.

**42.** ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

**43.** ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "සතා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

"සතා" යන්නෙන්, සත්ව ලෝකයේ යම් සාමාජිකයකුගේ ජීවන චක්‍රයේ යම් අවස්ථාවක වූ හෝ එහි යම් කොටසක් වූ යම් සාමාජිකයකු අදහස් වේ;";

(2) "ගව" යන යෙදුමේ අර්ථකථනයෙහි "හස්තීන්, මී ගවයන්, අශ්වයන්" , යන වචන වෙනුවට "හස්තීන්, මී ගවයන්, නොමුහුන් ගවයන්, අශ්වයන්" යන වචන ආදේශ කිරීමෙන්;

(3) "වර්ග කිරීමේ සළකුණ" යෙදුමේ අර්ථකථනය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්:—

"වර්ග කිරීමේ සළකුණ" යන්නෙන්, එහි ප්‍රභවය හෝ ඒ සම්බන්ධයෙන් කටයුතු කළ නියෝජිත ආයතනය සහ ඒ දැව අයත් වන පන්තිය දැක්වීම සඳහා දැව මත තබන ලද සළකුණක් අදහස් වේ;";

(4) "සංරක්ෂිත වනය" යන යෙදුමේ අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථකථන ඇතුළත් කිරීමෙන් :—

"දිස්ත්‍රික් ලේකම්" යන්නෙන්, පරිපාලන දිස්ත්‍රික්කයක් භාර දිස්ත්‍රික් ලේකම් අදහස් වේ ;

"ප්‍රාදේශීය ලේකම්" යන්නෙන්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය භාර ප්‍රාදේශීය ලේකම් අදහස් වේ.";

(5) "වන නිලධරයා" යෙදුමේ අර්ථකථනය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"වන නිලධරයා" යන්නෙන්, නමින් පත් කරන ලද හෝ වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂක, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂක, නියෝජ්‍ය වන සංරක්ෂක, සහකාර වන සංරක්ෂකයන්, ප්‍රාදේශීය වන නිලධරයන්, අතිරේක ප්‍රාදේශීය වන නිලධරයන්, ප්‍රාදේශීය සහකාර වන නිලධරයන්, විශේෂ වන පාලකයන්, වන පාලකයන්, අඩවි වන නිලධරයන්, අතිරේක අඩවි වන නිලධරයන්, බීට්ටු වන නිලධරයන්, ක්ෂේත්‍ර වන සහකරුවන්, වන මුරකරුවන්, වන කම්කරුවන් හෝ වගා කම්කරුවන් වශයෙන් ධුර දරන්නන් ලෙස පත් කරනු ලබන තැනැත්තන් හෝ යම් තැනැත්තකු සහ මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ රීතියක විධිවිධාන යටතේ වන නිලධරයකුගේ යම් කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා නමින් හෝ ධුරයෙන් පත් කරන ලද වෙනත් යම් තැනැත්තකු අදහස් වේ ;";

(6) "වන නිෂ්පාදන" යන යෙදුමේ අර්ථ කථනයෙහි —

(අ) "මැලියම් හා තිපල්" යන වචනවලින් ආරම්භ වන සියලු වචන වෙනුවට, "මැලියම්, තිපල් සහ පැළෑටි, සතුන් සහ පක්ෂීන්ගෙන් ගනු ලබන සාරය" යන වචන ආදේශ කිරීමෙන්, ;

(ආ) එහි (ඇ) ඡේදය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) දළ, අං, හැලුනු අං, අනුභවයට ගත හැකි කුරුළු කැදලි, සත්ව සම් සහ සත්ව කොටස්;";

(ඇ) එහි (ඈ) ඡේදයෙහි "පාෂාණ සහ ඛණිජ" යන වචන වෙනුවට, ගල් සහ ඛනිජ ද්‍රව්‍ය, වැලි, ගල් කැට, මැණික් හෝ මැණික් පතල් කැණීම මගින් ලබාගනු ලබන පස්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) (ඈ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඉ) ස්වාභාවික උල්පත්, ජලකර සහ වෙනත් ස්වාභාවික ජල ප්‍රභවයන්ගෙන් ලැබෙන ජලය;";

(7) "වන නිෂ්පාදන" යන යෙදුමේ අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"ග්‍රාම නිලධාරී" යන්නෙන්, ග්‍රාම නිලධාරී කොට්ඨාශයක් භාර ග්‍රාම සේවා නිලධාරී අදහස් වේ;";

(8) "දිසාපති" යන යෙදුමේ අර්ථකථනය ඉවත් කිරීමෙන්;

(9) "ගම් මුලාදෑනියා" යන යෙදුමේ අර්ථකථනය ඉවත් කිරීමෙන් ;

(10) "බන්ධනාගාරගත කිරීම" යන යෙදුමේ අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"තැනැත්තා" යන්නට, සංස්ථාගත හෝ සංස්ථාගත නොවූ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;";

(11) "ශාකය" යන යෙදුමේ අර්ථකථනය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"ශාකය" යන්නෙන්, ශාක ජීවන චක්‍රයේ යම් කොටසක් ද ඇතුළුව, ශාක රාජධානියේ යම් සාමාජිකයකු අදහස් වන අතර, වෙලී නගින වැල් හෝ දැවමය හෝ අන්‍යාකාර වූ වැල්, ගස්, හීන් පඹ, පාසි, උපරිජීවී පැළෑටි හෝ එහි යම් කොටසක්, ඇට, මල් හෝ ඒවායේ යම් කොටස් ද ඇතුළත් වේ;" ;

(12) "පොලිස් නිලධරයා" යන යෙදුමේ අර්ථකථනය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"පොලිස් නිලධරයා" යන්නෙන්, (53 වන අධිකාරය වූ) පොලිස් ආඥාපනත යටතේ පත් කරන ලද්දා වූ හා පොලිස් දෙපාර්තමේන්තුවේ අවස්ථාවෝචිත පරිදි නිත්‍ය සේවයේ, පොලිස් උප සේවයේ හෝ විශේෂ කාර්ය බලකායේ, සේවයේ යෙදී සිටින්නා වූ යම් පොලිස් නිලධරයෙක් අදහස් වේ ;";

(13) "ගඟ" යන යෙදුමේ අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"රජයේ ඉඩම" යන්නෙන්, (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනත යටතේ අර්ථකථනය කරන ලද යම් ඉඩමක් අදහස් වේ;';

(14) "දැව ගබඩාව හෝ දැව අංගනය" යන යෙදුමේ අර්ථකථනයෙහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"දැව ගබඩාව" යන්නට දර මඩුවක්, විකිණීම සඳහා දැව ගෘහ භාණ්ඩ හෝ ලී බඩු විකිණීම සඳහා තැබූ යම් සාප්පුවක් හෝ ප්‍රදර්ශනාගාරයක් හා යන්ත්‍ර හෝ අන්‍යාකාර වූ දේ යොදා ගනිමින් වඩු වැඩ කරගෙන යනු ලබන ස්ථානයක්, යම්

දැව විකුණුම් හලක්, පොළොවට සවි කරන ලද හෝ අන්‍යාකාර වූ ලී පට්ටලයක් හෝ දැව පදම් කිරීමේ සහ සකස් කිරීමේ කර්මාන්ත ශාලාවක් ඇතුළත් වේ. තව ද, යම් අත් ට්‍රැක්ටරයක් ජංගම ලී මෝලක් ලෙස භාවිත වන්නේ නම්, එවැනි අත් ට්‍රැක්ටරයක් ද ඇතුළත් වන අතර, එසේ වුව ද, ඒ සඳහා බලයලත් නිලධරයකු විසින් නීත්‍යානුකූලව නිකුත් කරන ලද අවසර පත්‍රයක් මත යම් වැඩ බිමකට ගෙනෙනු ලබන දැව යොදා ගනිමින් ලී බඩු සාදන හෝ ලී මෝස්තර දමන ඒ වැඩබිමේ ඇති යම් තාවකාලික වඩුමඩුවක් ඊට ඇතුළත් නොවේ;";

(15) "ගස" යන යෙදුමේ අර්ථකථනය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට, පහත දැක්වෙන අලුත් අර්ථකථන ආදේශ කිරීමෙන් :—

"ගස" යන්නට, උණ ගස්, ලී කොට සහ කැපූ අතු, තාල වර්ගයේ ගස්, වේවැල්, දාරුක, දැවමය හෝ අන්‍යාකාර වූ වෙලී නගින වැල් හෝ වැල්බට සහ සියලු වර්ධන තත්ත්වයන් හි වූ ගස් ඇතුළත් වේ ;

"වාහනය" යන්නට, බෝට්ටුවක්, කරත්තයක්, මෝටර් වාහනයක්, ට්‍රේලරයක්, කන්ටේනරයක්, පහුරක්, බත්තලක් හෝ මෝටර් යාන්ත්‍රික හෝ අන්‍යාකාර හෝ වූ වෙනත් යම් ප්‍රවාහන ක්‍රමයක් ද ඇතුළත් වේ.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**44.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

**45.** ප්‍රධාන ප්‍රඥප්තියේ III වන සහ IV වන උපලේඛන මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛන ආදේශ කරනු ලැබේ :—

"III වන උපලේඛනය (74 වන වගන්තිය)

වන ආඥාපනතේ විධිවිධාන යටතේ රු. .................. ක මුදලක්, .................. හි .................. ගෙන් රජයට අයවිය යුතු හෙයින් සහ එකී මුදල, එකී .................. විසින් ගෙවා නොමැති හෙයින් ද,

එකී .................. ගේ දේපළ වන .................. ඉඩම, එකී ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තහනමට ගනු ලැබීමෙන් සහ ඊට අනුකූලව .................. වන දින විකුණනු ලැබ ඇත. ඉඩම .................. හි......... විසින් .................. ක් වූ මුදලට මිලට ගනු ලැබ, එම මුදල, එකී .................. විසින් යථා පරිදි ගෙවන ලදී.

දිසා ලේකම් .................. වන මම, එකී ආඥාපනතින් මා වෙත පැවරී ඇති බලය ප්‍රකාර, එකී බලතල ක්‍රියාත්මක කරමින්, පහත දැක්වෙන දේපළ, එනම්, (මෙහි මායිම් පිළිබඳ විශේෂ නිරවද්‍යතාවයක් ඇතිව, දේපළ විස්තර කරන්න) රු .................. ක් වූ මුදලට එකී .................. ට විකුණන ලදුව, ඔහු විසින් මිලට ගත් බවත්, ඔහු විසින් එම මුදල යථා පරිදි ගෙවනු ලැබ ඇති බව සහ මෙතැන් පටන් එකී ස්ථානය, එකී .................. වෙත, ඔහුගේ උරුමක්කරුවන්, පොල්මඃකරුවන් හෝ අද්මිනිස්ත්‍රාත්කරුවන් වෙත සියලු බැඳීම්වලින් තොරව, නතුකර, පවරන බව මෙයින් සහතික කරමි.

.................. ක් වූ මෙදින මාගේ අත්සන යටතේ දෙන ලදී.

..................
(අත්සන)

දිස්ත්‍රික් ලේකම්.

IV වන උපලේඛනය (75 වන වගන්තිය)

.................. පදිංචි .................. යන අයගෙන් වන ආඥාපනතේ විධිවිධාන යටතේ රු .................. ක මුදලක් රජයට අයවිය යුතුව තිබී, එකී .................. විසින් එකී මුදල නොගෙවන ලද හෙයින් ද,

එකී .................. ගේ දේපළ වූ .................. යන ඉඩම එකී ආඥාපනතට අනුකූලව තහනමට ගෙන ඊටම අනුකූලව .................. යන දින විකුණනු ලැබ, දිස්ත්‍රික් ලේකම් වන .................. යන මා විසින් රු. .................. මුදලකට එකී දේපළ මිල දී ගනු ලැබ, රජයට අයවිය යුතු වූ රු. .................. මුදල් කොටසක් (හෝ අවස්ථාවෝචිත පරිදි සම්පූර්ණ මුදල) ගෙවා නිම කිරීම් වශයෙන් එකී මුදල රජයට බැර කරන ලද හෙයින් ද,

දිස්ත්‍රික් ලේකම් වන .................. නමැති මා වෙත එකී ආඥාපනත මගින් මේ සඳහා පවරා ඇති බලය ප්‍රකාර සහ ඒ බලය ක්‍රියාවේ යොදවමින්, පහත සඳහන් දේපළ එනම් (මායිම් නිරවද්‍යතාවය පිළිබඳ විශේෂ සැලකිලි සහිතව විස්තර කරන්න) රු. .................. මුදලකට රජය වෙනුවෙන් සහ රජය සඳහා මිළට ගන්නා ලද බවත්, එකී මුදල රජයට බැර කරන ලද බවත්, එකී දේපළ සියලු බැඳීම්වලින් තොරව රජය වෙත සතු කරනු ලබන බවත්, සතුවිය යුතු බවත් මෙයින් දැනගත යුතු ය.

.................. වන මෙදින මගේ අත්සන යටතේ දෙන ලදී.

..................
අත්සන
දිස්ත්‍රික් ලේකම්වරයා.

V වන උපලේඛනය

I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති වගන්තිවල, II වන තීරුවේ අනුරූපී සටහනේ දක්වා ඇති වචන වෙනුවට, III වන තීරුවේ අනුරූපී සටහනේ දක්වා ඇති වචන ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ

| I වන තීරුව | II වන තීරුව | III වන තීරුව |
|---|---|---|
| 4 | දිසාපති | දිස්ත්‍රික් ලේකම් |
| 24(1) | ලංකා | ශ්‍රී ලංකා |
| 49අ | දිසාපති | දිස්ත්‍රික් ලේකම් |
| 53අ | දිසාපති | දිස්ත්‍රික් ලේකම් |
| 57 | දිසාපති | දිස්ත්‍රික් ලේකම් |
| 72 | දිසාපති | දිස්ත්‍රික් ලේකම් |
| 73 | දිසාපති | දිස්ත්‍රික් ලේකම් |
| 74 | දිසාපති | දිස්ත්‍රික් ලේකම් |
| 75 | දිසාපති | දිස්ත්‍රික් ලේකම්.”. |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.